Australian
**BORDER FORCE**

# Immigration Detention Facility Conditions of Entry
# සංක්‍රමණ රැඳවුම් පහසුකමට ඇතුළුවීමේ කොන්දේසි

Form
**1512B SIN**
SINHALESE

# ඇතුළුවීමේ කොන්දේසි

## හදුනා ගැනීමේ අවශ්‍යතා

සංක්‍රමණ රැඳවුම් මධ්‍යස්ථානයට ඇතුළුවීමට පෙර, වයස අවුරුදු 18 සහ ඊට වැඩි අය (වැඩිහිටියන්) ඔබගේ අයදුම් පතෙහි ඇතුලත් කල වර්ණ ඡායාරූප හදුනා ගැනීම ඇතුළුව ලකුණු 100 ක හදුනා ගැනීමේ ලියකියවිලි ඉදිරිපත් කල යුතුය.

- උප්පැන්න සහතිකය, ගමන් බලපත්‍රය, පුරවැසි සහතිකය හෝ තානාපති ලියකියවිලි ඇතුළුව ගමන් බලපත්‍රයක ලක්‍ෂණ ඇති වෙනත් ලියවිල්ලක් සඳහා (හෝ Immicard) ලකුණු 70 ක වටිනාකම ඇත.
- කොමන්වෙල්ත් රජය හෝ ඕස්ට්‍රේලියානු ප්‍රාන්ත හෝ ටෙරිටරි රජයන් මගින් නිකුත් කල රියදුරු බලපත්‍රයක් සඳහා ලකුණු 40 ක වටිනාකමක් ඇත.
- ඉතිරි ලකුණු සඳහා ලියකියවිලි කිහිපයක් භාවිතා කල හැකිය. වැඩිදුර විස්තර සඳහා Australian Border Force (ABF) (ඕස්ට්‍රේලියානු දේශසීමා බලකාය) වෙබ් අඩවිය **https://www.abf.gov.au/about-us/what-we-do/border-protection/immigration-detention/visit-detention/identification-guidelines**

වයස අවුරුදු 16 හෝ ඊට වැඩි බාලවයස්කරුවන් විසින් ඇතුලත් වන ස්ථානයේදී බාලවයස්කාරයාගේ නම ඇතුලත් රියදුරු බලපත්‍රය, ගමන් බලපත්‍රය (දැනට වලංගු නැතිනම්, ගමන් බලපත්‍රය පසුගිය මාස දෙක ඇතුලත වලංගුව තිබිය යුතුය), මෙඩිකෙයාර් කාඩ්පත, සහන කාඩ් පත හෝ ශිෂ්‍ය හදුනාගැනීම් ඉදිරිපත් කල යුතුය.

වයස අවුරුදු 16 ට වඩා අඩු බාලවයස්කරුවන් හට සාමාන්‍යයෙන් හදුනා ගැනීමේ ලියවිලි නැතිව ඇතුළුවිය හැකි වුවද වගකිව යුතු වැඩිහිටියා විසින් සිය අයදුම් පත්‍රයේ ඔවුන් සමඟ එන අය ලෙස දක්වා තිබිය යුතුය.

ඡායාරූප හදුනා ගැනීමේ ඔබගේ වත්මන් ලිපිනය නැතිනම්, අමතර හදුනා ගැනීමේ ලියවිල්ලක් ඉදිරිපත් කල යුතුය. පිළිගත හැකි හදුනා ගැනීමේ ලියවිලි නිකුත් කල යුත්තේ ෆෙඩරල්, ප්‍රාන්ත හෝ පළාත් පාලන ආයතන, හෝ මුල්‍ය ආයතනයක් හෝ උපයෝගීතා සේවා සපයන අයෙකු විසින් වන අතර ඔබගේ නම සහ වත්මන් ලිපිනය යන දෙකම ඇතුලත් විය යුතුය. අමතර හදුනා ගැනීමේ ලියකියවිලි අතර බැඳුම්කර යොමු කරන කුවිතාන්සි, පළාත් පාලන ආයතනවල වරිපනම් දැන්වීම්, බැංකු ප්‍රකාශන, හෝ උපයෝගීතා බිල් ඇත.

## නීති වෘත්තිකයන් සහ/හෝ සංක්‍රමණ නියෝජිතයන්

ඔබ නීති වෘත්තිකයෙකු සහ/හෝ සංක්‍රමණ නියෝජිතයෙකු නම්, ආකෘතියේ සඳහන් කොන්දේසිවලට අමතරව පහත ලියකියවිලිද ඉදිරිපත් කල යුතුය:

- ඔබ නීති වෘත්තිකයෙකු හෝ සංක්‍රමණ නියෝජිතයෙකු බව සනාථ කරන සාක්‍ෂි;
- අදාල සංස්ථාපිත ලිපි ශීර්ෂයක ඔබව අදාල සමාගම/ව්‍යාපාරය මගින් සොලිසිටර්වරයෙකු, බැරිස්ටර්වරයෙකු, පැරාලීගල් හෝ සංක්‍රමණ නියෝජිතයෙකු වශයෙන් අදාල ආයතනයේ සේවය කරන බවටවූ ලිඛිත සනාථ කිරීමක්;
- ආයතනයෙන් නීති උපදේශ ඉල්ලා සිටි රැඳවුම්කරු(කරුවන්)ගේ නම් ඇතුලත් එක් එක් අයගේ නම් ඇතුලත් ඔවුන් වෙනුවෙන් කටයුතු කල බවට අත්සන් කල අධිකාරිය;
- රැඳවුම්කරු විසින් ඔවුන් නැරඹීමට කැමැත්ත ලබාදුන් බවට සාක්‍ෂි.

## සෞඛ්‍යය වෘත්තීකයන්

ඔබ සෞඛ්‍යය වෘත්තීකයෙකු නම්, (රැඳවුම් සෞඛ්‍යය සේවා සපයන්නකු මගින් නිරත කර නැතිනම්), ආකෘතියේ ඉහත සඳහන් කොන්දේසිවලට අමතරව, පහත ලියකියවිලිද ඉදිරිපත් කල යුතුය:

- ඔබගේ වෛද්‍ය හෝ වෙනත් අදාල සෞඛ්‍යය වෘත්තීකයෙකු බව සනාථ කරන සාක්‍ෂි;
- අදාල රැකියාව සම්බන්ධ සාක්‍ෂි;
- රැඳවුම්කරු විසින් ඔවුන් නැරඹීමට කැමැත්ත ලබාදුන් බවට සාක්‍ෂි.

## නිල වශයෙන් පැමිණෙන අමුත්තන්

ඔබ නිල අමුත්තෙකු නම් (බාහිර නියාමන ආයතනයක, නීතිය බලාත්මක කරන ආයතනයක හෝ ප්‍රාන්ත/ටෙරිටරි සුබසාධන ආයතනයක නියෝජිතයෙකු, මෙම ආකෘතියේ දක්වා ඇති කොන්දේසිවලට අමතරව, පහත ලියකියවිලිද ඉදිරිපත් කල යුතුය:

- ඔබගේ වෘත්තීය/සේවායෝජකයා සම්බන්ධ සාක්‍ෂි; සහ
- රැඳවුම්කරු (කරුවන්) සමඟ සම්බන්ධවීමට බලාපොරොත්තු වන්නේ නම්, රැඳවුම්කරු (කරුවන්) විසින් ඔවුන් නැරඹීමට කැමැත්ත ලබාදුන් බවට සාක්‍ෂි.

## පාර්ලිමේන්තු සහ රජයේ නියෝජිතයන්

ඔබ පාර්ලිමේන්තු සහ රජයේ නියෝජිතයන් නම් සහ රැඳවුම්කරු (කරුවන්) සමඟ සම්බන්ධවීමට බලාපොරොත්තු වන්නේ නම්, මෙම ආකෘතියේ සඳහන් ලියකියවිලිවලට අමතරව, රැඳවුම්කරු (කරුවන්) විසින් ඔවුන් නැරඹීමට කැමැත්ත ලබාදුන් බවට සාක්‍ෂි.

## කොන්සියුලර් නිලධාරීන් හෝ විදේශ රජයේ නියෝජිතයන්

ඔබ කොන්සියුලර් නිලධාරීන් හෝ විදේශ රජයේ නියෝජිතයන් නම්, මෙම ආකෘතියේ සඳහන් ලියකියවිලිවලට අමතරව, රැඳවුම්කරු විසින් ඔවුන් නැරඹීමට කැමැත්ත ලබාදුන් බවට සාක්‍ෂි.

## අධ්‍යාත්මික රැකවරණය ලබා දෙන ස්වේච්ඡා සේවකයන්, ප්‍රජා කණ්ඩායම් සහ අමුත්තන්

ඔබ ස්වේච්ඡා සේවකයකු සහ/හෝ ප්‍රජා කණ්ඩායමක සාමාජිකයෙකු වන අතර අනුමත වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා රැඳවුම් පහසුකමකට යාමට බලාපොරොත්තු වන්නේ නම්, මෙම ආකෘතියේ සඳහන් කොන්දේසිවලට අමතරව, (අදාල අවස්ථාවල) ගොදුරු විය හැකි ළමුන්/අය සඳහාවූ පරීක්‍ෂණ ඇතුළුව ඕස්ට්‍රේලියානු ෆෙඩරල් පොලිස් පරීක්‍ෂණ සහ නීතිය මගින් අවශ්‍ය වෙනත් පරීක්‍ෂණ කරගත යුතුය.

## කොන්ත්‍රාතකරුවන්

ඔබ සංක්‍රමණ රැඳවුම් පහසුකම තුල වැඩ කරන කොන්ත්‍රාත්කරුවෙකු නම්, මෙම ආකෘතියේ සඳහන් කොන්දේසිවලට අමතරව, පහත ආකාරයට කටයුතු කල යුතුය:

- ඔබට වැඩ කිරීමට හැකි තැන් සහ ඔබව Facilities and Detainee Service Provider (FDSP) (පහසුකම් සහ රැඳවුම් සේවා සපයන්නා) කාර්ය මණ්ඩලය මගින් පරිවාර කල යුතු අවස්ථා ඇතුළුව ඉන්ඩක්ෂන් කාලයේ ඔබට ලබාදුන් විධානයන්ට අනුකූලව කටයුතු කල යුතුය;
- වැඩ කිරීමට අවශ්‍ය අදාල සියළු බලපත්‍ර, සුදුසුකම් සහ රක්‍ෂණ ආවරණ තිබිය යුතුය;

© COMMONWEALTH OF AUSTRALIA, 2022

- රාජකාරි ආරම්භ කිරීමට පෙර හෝ කිසියම් සේවාවක් සැපයීමට පෙර ඕස්ට්‍රේලියානු ෆෙඩරල් පොලිස් පසුබිම් පරීක්ෂණයක් තිබිය යුතුය;
- වැඩ කිරීමට මෙවලම් අවශ්‍ය අවස්ථාවලදී:
  - අදාල විශේෂිත කටයුත්ත කිරීමට අවශ්‍ය විශේෂිත මෙවලම් සහ උපකරණ පමණක් සංක්‍රමණ රැඳවුම් පහසුකමට රැගෙන ආ යුතු අතර කිසිම මෙවලමක් නිදහසේ නොතැබිය යුතුය;
  - සියළුම මෙවලම් සම්පූර්ණ විස්තරයක් සහිතව මෙවලම් ලේඛණයේ සටහන් කරන බවට වග බලා ගත යුතු අතර, පිටව යන විට FDSP කාර්ය මණ්ඩලය විසින් ඒවා ඉවතට ගෙන යන බවට සටහන් කරවා ගත යුතුය;
  - ස්ථානයේ තබන කිසියම් මෙවලමක් ඇතිනම් ඒවා FDSP කාර්ය මණ්ඩලයේ අධීක්ෂණයට යටත්ව තබන බවට වග බලා ගන්න; සහ
  - සුදුසු රාජකාරී ඇඳුම් පළඳින්න (හොඳින් පෙනෙන ඇඳුම් සහ වැඩට අඳින බූට්).

## සියළු අමුත්තන්

සංක්‍රමණ රැඳවුම් පහසුකමට පැමිණෙන විට සහ පිටව යන සියළුම අමුත්තන් විසින් අමුත්තන්ගේ ලේඛණය අත්සන් කල යුතුය.

ඇතුළුවීමේ කොන්දේසියක් වශයෙන් සියළුම අමුත්තන් සහ ඔවුන්ට අයත් දේ ආරක්ෂණ පරීක්ෂාවකට යටත් කිරීමට ඉල්ලා සිටිනු ඇත. ඒවා අතර, අතෙහි තබා සිටින ස්කෑනර්, උපකරණය තුලින් ඇවිදගෙන යා යුතු ස්කෑනර්, එක්ස්- රේ සහ මත්ද්‍රව්‍ය සොයා ගන්නා උපකරණ භාවිතය ඇතුලත්වේ. නිලධාරියෙකු විසින් ඔබ සතුව ඇති භාණ්ඩ පරීක්ෂාවට සහ/හෝ එක්ස්- රේ සෝදිසි හරහා එම උපකරණ යවන ලෙස ඉල්ලා සිටිය හැකිය. මෙම ඉල්ලීම හා අනුකූලවීමට ඔබ බැඳී නැත. කෙසේ වුවද, ඔබ අනුකූලව කටයුතු නොකලහොත්, ඔබට සංක්‍රමණ රැඳවුම් පහසුකමට ඇතුළුවීම ප්‍රතික්ෂේප කල හැකිය.

ඔබ මත් ද්‍රව්‍ය හෝ මත්පැන්වල බලපෑම යටතේ නොසිටිය යුතුය.

ඇතුළුවීමේ කොන්දේසියක් වශයෙන් සියළුම අමුත්තන් සෞඛ්‍යය පරීක්ෂාවකට යටත් විය යුතුය. සෞඛ්‍යය පරීක්ෂාව සිදු කරන්නේ අදාල බල ප්‍රදේශ මහජන සෞඛ්‍යය ඒකකයේ සහ වෙනත් සෞඛ්‍යය බලධාරීන්ගේ උපදෙස් මත වන අතර අපගේ සංක්‍රමණ රැඳවුම් පහසුකමට ඇතුළුවන අයගේ COVID-19 ඇතුළු අසනීපවවලට ඇති අවදානම අඩු කිරීම සඳහාය. මේවා අතර, උදාහරණ වශයෙන්, සෞඛ්‍යය පරීක්ෂා කර බැලීමේ ප්‍රශ්නාවලියක්, උෂ්ණත්වය බැලීම සහ COVID-19 සර්වෙයිලන්ස් පරීක්ෂණ තිබිය හැකිය.

ඔබ සෞඛ්‍යය පරීක්ෂණ ක්‍රියාවලිය සමත් නොවුනහොත්, නැතිනම් ඔබගේ සෞඛ්‍යය තත්වය ගැන සැකයක් ඇතිනම්:

- ඔබට සංක්‍රමණ රැඳවුම් පහසුකමට ඇතුළුවීම ප්‍රතික්ෂේප කිරීම; සහ
- ඔබගේ ගමන නැවත පිළියෙල කර ගත යුතුය,

අමුත්තන් විසින් **ඔවුන් සිය COVID-19 එන්නත් ලබාගෙන යාවත්කාලීන** බවට සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය විය හැකිය.

ඔබ විසින් අත්වල සනීපාරක්ෂාව, කහින විට අනුගමනය කල යුතු ක්‍රියා පිළිවෙත් සහ ශාරීරික දුරස්ථබව සම්බන්ධ අවශ්‍යතා ඇතුළුව සනීපාරක්ෂක/ආසාදන පාලන ක්‍රියාමාර්ගවලට අනුව කටයුතු කල යුතු අතර මෙම අවශ්‍යතා මේවාට පමණක් සීමා නොවේ.

ඔබගේ පුද්ගලික තොරතුරු රැස් කිරීම ස්වේච්ඡාවෙන්වේ. ඔබගේ පුද්ගලික තොරතුරු රැස් කරන්නේ සංක්‍රමණ රැඳවුම් පහසුකම්වල Department of Home Affairs (ස්වදේශීය කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව) වෙනුවෙන් සෞඛ්‍යය පරීක්ෂණ සිදු කරන ගිවිසුම්ගත සේවා සපයන්නන්ගේ කාර්ය මණ්ඩලය මගිනි.

ඔබගේ පුද්ගලික තොරතුරු ලේඛණයක ඇතුලත් කරන අතර නීතියට අනුකූලව අවශ්‍ය අවස්ථාවල හෙළිදරව් කරනු ඇත (දෙපාර්තමේන්තුවට ඇතුළුව) **(පුද්ගලිකතාවය සම්බන්ධ වැදගත් තොරතුරු** බලන්න).

වරදක් සිදු නොවන ආකාරයේ පිංතූරු හෝ පාඨ ඇතුලත් ඇඳුම් නොපැළඳීම ඇතුළුව ප්‍රසිද්ධ ස්ථානයකට සරිලන ලෙස නිසි පරිදි ඇඳුම් පැළඳිය යුතුය. වෘත්තීය සංවිධානවල නියෝජිතයන් නියම කරන ලද නිල ඇඳුම් හෝ නියෝජන ඇඳුම් නොපළඳින අවස්ථාවල වෘත්තීයමය ආකාරයට ඇඳ පැළඳ සිටිය යුතුය (ව්‍යාපාරික ඇඳුම්). රාජකාරී සෞඛ්‍යය සහ ආරක්ෂක හේතු මත, සංවෘත සපත්තු (අඩි උස සපත්තු නොමැත) පැළඳිය යුතුය.

සංක්‍රමණ රැඳවුමක සිටින පුද්ගලයෙකු විසින් අමුත්තෙකුගේ පැමිණීම ප්‍රතික්ෂේප කිරීමට ඇති අයිතියට ගරු කල යුතුය.

## සංක්‍රමණ රැඳවුම් පහසුකමට දේවල් රැගෙන ඒම

ඕස්ට්‍රේලියානු නීතිය මගින් ඔබ සන්තකයේ තබාගැනීම තහනම් කිසිම දෙයක් සංක්‍රමණ රැඳවුම් පහසුකමට රැගෙන ඒමට ඔබ විසින් උත්සාහ නොකල යුතුය. ඕස්ට්‍රේලියානු නීතියට කොමන්වෙල්ත් නීතියක්, ප්‍රාන්ත හෝ ටෙරිටරි නීතියක් ඇතුලත්වේ. ඔබ ලඟ හෝ ඔබ සන්තකයේ තිබී සොයාගත් කුමන හෝ දෙයක් නැවත ඔබට ලබා නොදෙන අතර පොලීසිය වෙත යොමු කරනු ඇත.

ඔබ විසින් සංක්‍රමණ රැඳවුම් මධ්‍යස්ථානය වෙත පාලිත දේවල් රැගෙන ඒමට උත්සාහ නොකල යුතුය. පාලිත දේවල් ඔබ විසින් ඕස්ට්‍රේලියාව තුල නීත්‍යානුකූලව තබාගත හැකි වුවද ඒවා මගින් සංක්‍රමණ රැඳවුම් පහසුකමේ සෞඛ්‍යයට, පුද්ගලිකත්වයට, ආරක්ෂාවට, සුරක්ෂිතභාවයට හෝ සාමකාමී බවට අවදානමක් ඇතිකල හැකි බැවින් ඒවා ගෙන ඒමට අවසර නැත. ඔබ සංක්‍රමණ රැඳවුම් පහසුකමට පැමිණෙන විට ඔබ සන්තකයේ මේවා තිබේ නම්, ඔබ විසින් කාර්ය මණ්ඩලයට ඒ බව දැනුම් දිය යුතු අතර ඔබ අමුත්තන්ගේ ප්‍රදේශයට ඇතුළුවීමට පෙර ඒවා ගබඩා කල යුතුය. සංක්‍රමණ රැඳවුම් පහසුකමේ සෞඛ්‍යයට, පුද්ගලිකත්වයට, ආරක්ෂාවට, සුරක්ෂිතභාවයට හෝ සාමකාමී බවට අවදානමක් ඇතිකල හැකි කිසියම් දෙයක් ඔන සන්තකයේ ඇතිනම්, ඔබට සංක්‍රමණ රැඳවුම් පහසුකමට ඇතුළුවීමට අවසර ලබා නොදෙනු ඇත.

යම් දෙයක් තහනම්ද නැතිනම් පාලිතද යන්න ඔබට සැකයක් ඇතිනම්, සංක්‍රමණ රැඳවුම් පහසුකමට ඇතුළුවීමට **පෙර** පරීක්ෂණ නිලධාරීන් හට ඒවා ඇති බව ප්‍රකාශ කල යුතුය. ඔබ අමුත්තන් නරඹන අතර පුද්ගලික දේවල් ගබඩා කිරීමට අවශ්‍ය නම්, ඒ සඳහා ලොකර් පහසුකම් තිබිය හැක. තහනම් සහ පාලිත දේවල්වලට උදාහරණ සංක්‍රමණ රැඳවුම් පහසුකමට ඇතුළුවන ස්ථානය අසල ඇති සංඥා පුවරුවල සහ ABF වෙබ් අඩවිය වන **https://www.abf.gov.au/about-us/what-we-do/border-protection/immigration-detention/visit-detention** හි දක්වා ඇත.

රැඳවුම්කරුවකු සඳහා වන කිසියම් දෙයක් ඇතිනම් පරීක්ෂා කිරීම සඳහා අමුත්තන් පිළිගන්නා ස්ථානයේදී භාර දිය යුතු අතර, ඉහත දක්වා ඇති කරුණු හේතුවෙන් ඇතුලට යාම වැළැක්වීමට ඉඩ ඇත.

රැඳවුමේ සිටින අය විසින් තබාගත හැකි දේපළවල උපරිම සීමා ඇත. මෙම සීමාව ඉක්මවා යන්නේ නම් අමුත්තන් විසින් රැගෙන එන දේපළ ගෙන ඒම වැළැක්විය හැකිය.

සංක්‍රමණ රැඳවුම් පහසුකමට ඔබ විසින් රැගෙන එන පුද්ගලික දේවල් ඔබගේ වගකීමවේ. ඔබ සංක්‍රමණ රැඳවුම් පහසුකම තුල සිටින අතර ඔබගේ පුද්ගලක දේවලට සිදුවන කිසිදු අලාභයකට දෙපාර්තමේන්තුව වගකීමක් භාර නොගනී. ඔබගේ පුද්ගලික දේවල් ඔබගේ සන්තකයේ තබා ගැනීම සම්බන්ධ වගකීම ඔබට ඇති අතර ඔබ සංක්‍රමණ රැඳවුම් පහසුකමින් පිටත්ව යන විට ඒවා ඔබ විසින් රැගෙන යා යුතුය.

## උපකාරක සතුන්

සංක්‍රමණ රැඳවුම් මධ්‍යස්ථානයට ඇතුළුවීමට අවසර දීමට පෙර සිය සතුන් උපකාරක සතුන් හෝ සතුන් නිසි සනීපාරක්ෂක සහ හැසිරීම් සම්මතයන්ට අනුව කටයුතු කිරීමට පුහුණු කර ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන ලෙස පහසුකමට පැමිණෙන අමුත්තන්ගෙන් ඉල්ලා සිටිය හැකිය.

සියළුම අවස්ථාවල උපකාරක සතුන් අමුත්තන් විසින් අධීක්ෂණයට ලක්කල යුතු අතර සංක්‍රමණ රැඳවුම් පහසුකමේ අමුත්තන්ගේ ප්‍රදේශයේ තාවකාලිකව සිටිය යුතු අතර නැරඹීමට පැමිණි කාලයට පමණක් මෙය සීමා වනු ඇත.


© COMMONWEALTH OF AUSTRALIA, 2022

අදාල ආරක්ෂක පරීක්ෂා කිරීම් ක්‍රියාපටිපාටීන්ට අනුකූලව උපකාරක සතුන්ව පරීක්ෂා කිරීම සඳහා අමුත්තන් විසිනි අවසර ලබා දිය යුතුය. මෙම ක්‍රියාපටිපාටිවලදී අමුත්තන් විසින් උපකාර කරන ලෙස ඉල්ලා සිටිය හැකිය. මෙම සෝදිසි කිරීම් අතර උපකාරක සතුන්ගේ ඇඳුම් පැළඳුම්ද ඇතුලත්වේ.

## නැරඹීමට පැමිණි විට හැසිරීම

ඔබ විසින් සංක්‍රමණ රැඳවුම් පහසුකමේ රීතීන්ට අවනත විය යුතු අතර, කාර්ය මණ්ඩලය විසින් දෙනු ලබන සාධාරණ විධානයන්ට අනුව කටයුතු කල යුතුය. අමුත්තන් සිටින ප්‍රදේශ ප්‍රසිද්ධ ස්ථාන ලෙස ඔබ පිළිගනී. ඔබ අනෙක් අයට ගරු කරන ආකාරයට හැසිරිය යුතු අතර සංක්‍රමණ රැඳවුමේ සිටින අය හෝ වෙනත් අයට කරදර නොකරන ආකාරයට හැසිරිය යුතුය. සංක්‍රමණ රැඳවුම් පහසුකමේ සෞඛ්‍යයට, පුද්ගලිකත්වයට, ආරක්ෂාවට, සුරක්ෂිතභාවයට හෝ සාමකාමී බවට අහිතකර ලෙස බලපාන ආකාරයේ කිසිදු හැසිරීමකට ඔබ කිසිවෙකු උනන්දු නොකරන අතර ඔබ එවැනි හැසිරීමක නිරත නොවිය යුතුය.

ඔබට ලබා දුන් අමුත්තන් හදුනා ගැනීමේ කාඩ්පත ඔබ එහි රැඳී සිටින කාලය තුල සියළුම කාර්ය මණ්ඩලයට පෙනෙන ආකාරයට පැළඳිය යුතු අතර, කාර්ය මණ්ඩලයෙන් අවසර ලබාදුනහොත් මිස සංක්‍රමණ රැඳවුම් පහසුකමේ වෙනත් ප්‍රදේශ වෙත නොගිය යුතුය.

සංක්‍රමණ උපදෙස් ලබා දීමට අවසර ඇති අයෙකු නම් මිස ඔබ විසින් සංක්‍රමණ උපදෙස් ලබා නොදිය යුතුය. *Migration Act 1958* (සංක්‍රමණ පනත) මගින් වෙනත් අයෙකුට සංක්‍රමණ උපදෙස් ලබා දිය හැක්කේ කා විසින්ද යන්න සම්බන්ධයෙන් දැඩි සීමා පනවයි. Migration Act මගින් කුමන ක්‍රියාවන් සංක්‍රමණ උපදෙස් යන්නේද යනුවෙන් දක්වා ඇත. සංක්‍රමණ උපදෙස් ලබා දීමට අවසර නැති අයෙකු විසින් සංක්‍රමණ උපදෙස් ලබා දෙන අයෙකු විසින් අපරාධ වරදක් සිදු කරන අතර $10,000 කට වැඩි නොවන දඩුවමකට යටත් විය හැකිය.

ඔබ සමඟ කිසියම් බාල වයස්කරුවෙකු පැමිණෙන්නේ නම් ඔවුන්ව ඔබ විසින් සෑම විටම අධීක්ෂණය කල යුතුය.

ඔබට රැඳවුම්කරුවෙකු හෝ අමුත්තෙකු සම්බන්ධයෙන් ගැටළුවක් ඇතිනම්, කාර්ය මණ්ඩලය වෙත යොමු කල යුතුය. ඔබට ඇති කිසියම් ගැටළුවක් සම්බන්ධයෙන් වාර්තා කල හැකි ආකාරය සම්බන්ධයෙන් අමුත්තන්ගේ ප්‍රදේශවල දැන්වීම් ප්‍රදර්ශනය කර ඇත.

## ඇතුළුවීම ප්‍රතික්ෂේප කිරීම සහ නැරඹීම අවසාන කිරීම

Immigration Detention Visitor Program (සංක්‍රමණ රැඳවුම් නැරඹීමේ වැඩසටහන) යටතේ පුද්ගලයන් පැමිණීම සෞඛ්‍යය, ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය ඇතුළු (මේවාට පමණක් සීමා නොවේ) මෙහෙයුම් හේතු නිසා ඕනෑම අවස්ථාවක තාවකාලිකව අත්හිටවිය හැකිය.

පහත අවස්ථාවල ඔබට සංක්‍රමණ රැඳවුම් පහසුකමට ඇතුළුවීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඔබගේ නැරඹුම අවසාන කිරීම කල හැකිය:

- ඔබ සන්තකයේ ඇති සියළුම දේ ප්‍රකාශ කිරීමට අපොහොසත්වීම;
- විශේෂිත අතීත අපරාධ වරදකාරිත්වය ප්‍රකාශ කිරීමට අපොහොසත්වීම;
- ඔබගේ පැමිණීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැන්වීමක් කිරීමට අපොහොසත්වීම, පැමිණීම සඳහා අනුමැතිය ලැබී නැතිනම්, හෝ ඇතුළුවීමට නීතික බලය නැතිනම්;
- ඔබ විසින් ප්‍රමාණවත් හැඳුනුම් ලියකියවිලි ලබා දීමට අපොහොසත්වීම;
- ඔබ විසින් නියමිත ප්‍රදේශයේ සිටීමට අපොහොසත්වීම;
- ඔබ විසින් වග කියන බාලවයස්කරුවන් සෑම විටම අධීක්ෂණය කිරීමට සහ ඔබ සමඟ තබා ගැනීමට අපොහොසත්වීම;
- නිසි ඇඳුම් පැළඳුම් හෝ වසන ලද සපත්තු පැළඳීමට අපොහොසත්වීම;
- ඔබ විසින් මෙම ඇතුළුවීම සඳහාවූ කොන්දේසි පිළිගැනීම සහ හෝ අත්සන් කිරීම ප්‍රතික්ෂේප කිරීම;
- ඔබ විසින් සංක්‍රමණ රැඳවුම් පහසුකම් හැඳුනුම්පතක් පැළඳීම ප්‍රතික්ෂේප කිරීම (දක්වා ඇති අවස්ථාවල);
- සංක්‍රමණ රැඳවුම් මධ්‍යස්ථානයට ගෙන ඒමට තහනම් කල දේවල් භාර දීමට ඔබ විසින් ප්‍රතික්ෂේප කිරීම;
- ආරක්ෂණ සහ/හෝ සෞඛ්‍යය සෝදිසි කිරීම් හෝ පරීක්ෂණ ක්‍රියාපටිපාටීන් අනුව කටයුතු කිරීමට ප්‍රතික්ෂේප කිරීම;
- ඔබගේ හැසිරීම අනිසි හෝ වරදකාරී බවට සැලකීම හෝ සංක්‍රමණ රැඳවුම් පහසුකමේ හෝ සංක්‍රමණ රැඳවුම් පහසුකමේ සිටින පුද්ගලයන්ගේ ආරක්ෂාවට, සාමකාමීත්වයට හෝ සුරක්ෂිතභාවයට තර්ජනයක් වීම;
- ඔබ මත්පැන් පානය කර ඇති බව හෝ මත්ද්‍රව්‍ය භාවිතා කර ඇති බවට නිලධාරියෙකු විසින් සැක කිරීම;
- ඔබට අසනීප බවට නිලධාරියෙකු විසින් සැක කිරීම;
- සංක්‍රමණ රැඳවුම් පහසුකමක තබා ගැනීමට අවසරය නැති දෙයක් ඔබ රැගෙන එන බව නිලධාරියෙකු විසින් සැක කිරීම;
- ඕනෑම අවස්ථාවක මෙම ඇතුළුවීමේ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් බව නිලධාරියෙකු විසින් සැක කිරීම;
- සංක්‍රමණ රැඳවුම් පහසුකමේ ආරක්ෂාව, විනය, හෝ අසමගිය වැළැක්වීම හෝ අපරාධයක් සිදුවීම සම්බන්ධ ගැටළු මතුවී ඇතිවිට;
- බුද්ධිමය කටයුතු සම්බන්ධ ගැටළු, සහ/හෝ;
- වෙනත් මෙහෙයුම් කාරණා.

සංක්‍රමණ රැඳවුම් පහසුකම තුල සිටීම අවසානයට පත් කිරීම හෝ ඒ තුලට ඔබගේ පැමිණීම හෝ ඕනෑම දෙයක් ගෙන ඒම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධ කිසියම් තීරණයකට ඔබ විසින් ගරු කල යුතුය. ඉල්ලා සිටි විගස ඔබ විසින් සංක්‍රමණ රැඳවුම් පහසුකමින් ඉවත්ව යා යුතුය. ඒ ආකාරයට කටයුතු කිරීම ප්‍රතික්ෂේප කිරීම මගින් ඔබට අනාගතයේදී ඒ වෙත පැමිණීමේ හැකියාවට බලපෑ හැකි අතර පොලීසිය වෙත යොමු කිරීමද කල හැකිය.

## පැමිණිලි සහ අදහස්

ඔබ පැමිණි අවස්ථාවල පැමිණිල්ලක් යොමු කිරීම හෝ අදහස් දැක්වීම කල හැකිය. වැඩිදුර තොරතුරු දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන **https://www.homeaffairs.gov.au/help-and-support/departmental-forms/online-forms/complaints-compliments-and-suggestions** වෙතින් ලබා ගත හැකිය.

## පුද්ගලිකතාවය සම්බන්ධ වැදගත් තොරතුරු

ඔබගේ පුද්ගලික තොරතුරු ඇතුළුව *Privacy Act 1988* නීතීන් මගින් ආරක්ෂා කර ඇත. සංවේදී තොරතුරු ඇතුළු ඔබගේ පුද්ගලික තොරතුරු රැස්කිරීම, භාවිතා කිරීම සහ හෙළිදරව් කිරීම (විදේශ ආයතන ඇතුළු වෙනත් ආයතන සහ තුන්වන පාර්ශ්වයන් හට) *Privacy Notice Visitors to Immigration Detention Facilities (පුද්ගලිකතා දැන්වීම සංක්‍රමණ රැඳවුම් පහසුකම් වෙත එන අමුත්තන්)* හි 1553 ආකෘතියේ ඇතුලත්වේ. මෙය ABF වෙබ්අඩවියේ හෝ පහසුකම්වල ඇත. ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර ඔබ විසින් 1553 ආකෘතිය කියවා අවබෝධ කරගන්නා බවට සනාථ කර යුතුය.

## වැඩිදුර විස්තර

සංක්‍රමණ රැඳවුම් පහසුකම සම්බන්ධ තොරතුරු, සම්බන්ධවීමේ තොරතුරු, විවෘත කරන වේලාවන්, සහ අයදුම්පත්‍ර ඇතුළු වැඩිදුර විස්තර ABF වෙබ් අඩවිය වන **https://www.abf.gov.au/about-us/what-we-do/border-protection/immigration-detention/visit-detention** වෙතින් ලබා ගත හැකිය.

© COMMONWEALTH OF AUSTRALIA, 2022

# *Agreement*

**All visitors must read the *Conditions of Entry* on pages 1–3 of this form and sign this Agreement before entering the immigration detention facility.**

I declare that:

- I have read the *Conditions of Entry* on pages 1–3 of this form.
- I am not bringing any prohibited or controlled items into this immigration detention facility.

I understand that:

- failure to comply with the above conditions may result in:
  - refusal of entry to the immigration detention facility;
  - termination of the visit;
  - removal from the immigration detention facility; and

  that any such failure may negatively impact the approval of any application I may make for future visits to this or any other immigration detention facility.
- by signing this Agreement, I agree to comply with the *Conditions of Entry* on pages 1–3 of this form.

I acknowledge that:

- the Department collects personal information from me and that I have read the information contained in form 1553 *Privacy Notice Visitors to immigration detention facilities*. I consent to the collection, use and disclosure by the Department of my personal information, and the personal information of any accompanying minors of which I am the parent or guardian, for those purposes set out above and/or as described in form 1553 or as otherwise authorised or required by an Australian law.

# *ගිවිසුම*

**සියළුම අමුත්තන් විසින් සංක්‍රමණ රැඳවුම් පහසුකමට ඇතුළුවීමට පෙර ආකෘතියේ 1-3 පිටුවල ඇති *ඇතුලත්වීමේ කොන්දෙසි* කියවා මෙම ගිවිසුම අත්සන් කල යුතුය.**

මම පහත දේ ප්‍රකාශ කරමි:

- ආකෘතියේ 1-3 පිටුවල ඇති *ඇතුළුවීමේ කොන්දේසි* මා විසින් කියවන ලදී.
- මම මෙම සංක්‍රමණ රැඳවුම් මධ්‍යස්ථානය වෙත කිසිම තහනම් හෝ පාලිත දේ රැගෙන නොඑමි.

මම පහත දේ අවබෝධ කරගෙන සිටිමි:

- ඉහත කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වුවහොත් පහත දේ සිදුවිය හැකිය:
  - සංක්‍රමණ රැඳවුම් පහසුකමට ඇතුළුවීම ප්‍රතික්ෂේප කල හැක;
  - ගමන නැවැත්වීම;
  - සංක්‍රමණ රැඳවුම් පහසුකමින් ඉවත් කිරීම; සහ

  එවැනි ආකාරයේ අපොහොසත්වීම් හේතුවෙන් අනාගතයේදී මා විසින් මෙම හෝ වෙනත් කිසියම් සංක්‍රමණ රැඳවුම් මධ්‍යස්ථානයක් වෙත ඒමට ඉදිරිපත් කරන අයදුම්පත්‍රවලට අහිතකර ලෙස බලපෑ හැකිය.
- මෙම ගිවිසුමට අත්සන් කිරීම මගින්, මෙහි 1-3 පිටුවල ඇති *ඇතුළුවීමේ කොන්දේසිවලට* අනුකූලව කටයුතු කිරීමට මම එකඟ වෙමි.

මම පහත දේ පිළිගනිමි:

- දෙපාර්තමේන්තුව විසින් මාගේ පුද්ගලික තොරතුරු රැස් කරන අතර 1553 ආකෘතියේ *Privacy Notice Visitors to immigration detention facilities* යන්න කියවා ඇත. මම මාගේ සහ මා මව්පිය බව හෝ භාරකාරත්වය දරණ මා සමඟ කැටුව එන බාලවයස්කාරයන්ගේ පුද්ගලික තොරතුරු, ඉහතින් දක්වා ඇති සහ/හෝ 1553 ආකෘතියේ හෝ වෙනත් ආකාරයට බලය ලබාදී ඇති හෝ ඕස්ට්‍රේලියානු  නීතියක් මගින් අවශ්‍ය අරමුණු වෙනුවෙන් රැස් කිරීම, භාවිතය සහ හෙළිදරව් කිරීමට කැමැත්ත ලබා දෙමි.

Your full name
ඔබගේ සම්පූර්ණ නම

**Your signature**
**ඔබගේ අත්සන**

Day දවස | Month මාසය | Year වසර

Date
දිනය
/ /


© COMMONWEALTH OF AUSTRALIA, 2022